# ගොවීන් සංවිධානය වුව ද එයින් ලබන ප්‍රයෝජන ඉතා අල්ප වන්නේ ඇයි ?

*චිත්‍රා හතුරුසිංහ*
*පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරිනී*
*අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය*

අද්‍යතන අතීතයේ පටන් ගොවීන් සාමූහිකව සංවිධානයවීමට මූලික වශයෙන් හේතුවී තිබුණේ ඔවුන් මුහුණ පෑ විවිධාකාර ප්‍රශ්න වලින් මිදීමේ අපේක්ෂාවයි. ගොවීන් මුහුණ පාන ප්‍රශ්න අතර ඉතා වැදගත් තැනක් ගන්නේ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමට ඇති අඩු හැකියාව, ඔවුන්ගේ විකුණුම් සඳහා අඩු මිළක් ලැබීම, ඔවුන්ගේ මිළදී ගැනීම සඳහා ඉහළ මිළක් ගෙවීම සහ අතරමැදියන්ගේ හැසිරීම පිළිබඳව ඔවුන් දක්වන ආකල්ප වේ. ලෝකයේ වෙනත් රටවල නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති මගින් ගොවීන් සංවිධානය වීම තුළින් ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට මෙන්ම ඔවුන්ගේ අවශ්‍යතා මිළදී ගැනීමට ද හැකි වී තිබේ. ස්වාධීන සුළු ගොවි පවුල් ගණනාවකගේ සහයෝගය මත විශාල සහ බලයෙන් වැඩි ගොවීන් සමග තරඟ කිරීමට හැකියාවක් තිබෙන බවට මෙම ගොවි නායකයන් අතර හැඟීමක් තිබුණි.

අලෙවිකරණ සංවිධානයක් මගින් ගොවි නිෂ්පාදන අලෙවිය, ශ්‍රේණිගත කිරීම, ඇසිරීම, සැකසීම හෝ අනෙක් අලෙවිකරණ ක්‍රියාවලියන් වන ගබඩා කිරීම, ප්‍රවාහනය සහ මිළ කිරීම කළයුතු වේ. මෙවැනි සංවිධානයක අරමුණ විය යුත්තේ තම සංගමයේ සාමාජික ගොවීන්ගේ නිෂ්පාදන සඳහා හැකි ඉහළම ආදයම ආරක්ෂා කරදීමය.

අලෙවිකරණයේ නියැලෙන ඇතැම් සංවිධාන කොමිස් නියෝජිතයන් වශයෙන් පමණක්ම කටයුතු කරන අතර, ඇතැම් සංවිධාන වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමේ ක්‍රියාවලියේ පමණක්ම නියැලේ. මේ මගින් සාමාන්‍ය ලාභ ලබමින් නිෂ්පාදනය වැඩි කර ගැනීමට හැකි වන අතර, සාමාජිකයින්ගේ පුද්ගලික අරමුණු ඉටු කර ගැනීමට ද හැකි වේ.

නිෂ්පාදනය වැඩි කර ගැනීම තුළින් මහා පරිමාණ වාසි ලබා ගැනීමට හැකි වීම, ප්‍රාදේශීය ඒකාධිකාරයක් ගොඩ නහා ගත හැකි වීම, වෙළඳපොළට ඇතුළුවීමේ

බාධා ඇති කිරීම, කේවල් කිරීමේ ශක්තිය වැඩිකර ගත හැකි වීම, ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳපොලක් පවත්වාගෙන යාමට හැකිවීම, සහ සාමාජිකයන්ගේ දිගුකාලීන පැවැත්ම ආරක්ෂා කිරීම සඳහා සහයෝගය දිය හැකි වීම මෙවැනි සංවිධානයක් පවත්වා ගැනීමේ විශේෂ වාසි ලෙස දක්විය හැකිය.

අලෙවිකරණ කටයුතු වල නියැලෙන සමුපකාර සංගම් සැළකිය යුතු අන්දමින් ආරම්භ වූයේ 1920 ගණන් වල දෙවන ලෝක යුද්ධයෙන් පසු කාලයේදී ඉතා විශාල වශයෙන් කෘෂිභෝගවල මිළ පහළයාමේ ප්‍රතිඵලයක් වශයෙනි. ආර්ථික, සමාජයීය සහ තාක්ෂණික අංශයන්ගේ වෙනස්වීම නිසා 1930 ගණන්වල මෙම සමුපකාර සංගම්වල ජීවිත කාලය කෙටි විය.

ඉහත කී අවශ්‍යතාවන් ඉටු කර ගැනීම සඳහා ගොවීන් සංවිධානය වුව ද, ඒ බලාපොරොත්තු ඒ ආකාරයෙන්ම ඉටු කර ගැනීම ඔවුනට ප්‍රශ්නයක් වී තිබේ. මෙම සංවිධානයක සාමාජිකත්වය ගැනීමට නිෂ්පාදකයාගේ ආර්ථික තත්ත්වය ප්‍රශ්නයක් වන්නේ නැති නමුත්, ආර්ථික සහ තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් විශාල සහ සුළු පරිමාණ නිෂ්පාදකයන්ට එකසේ ඔවුන්ගේ කටයුතු කිරීමට නොහැකි වේ. මෙවිට විශාල වශයෙන් නිෂ්පාදන කටයුතුවල නියැලෙන ගොවියාගේ අපේක්ෂාවන් හා සුළු පරිමාණ නිෂ්පාදකයාගේ අවශ්‍යතාවයන් විවිධ වන විට සුළු පරිමාණ නිෂ්පාදකයන් එම සංවිධානය ගැන කලකිරී සංවිධානයෙන් ඉවත් වී යයි. නමුත් යම්කිසි සංවිධානයක් අවම නිෂ්පාදන මට්ටමක් නියම කර සාමාජිකත්වය වෙනස් කිරීමට උත්සාහ ගන්නේ නම් එම විෂමතාවයන් ඇති කරයි.

ඇතැම් අවස්ථාවල සංවිධානය තුළ සිටින සාමාජිකයන්ට ප්‍රමාණවත් කළමනාකරණ දැනුමක් නොමැති වීම හේතුවෙන් කළමනාකරණ කටයුතු කිරීමට පිටතින් සේවකයන් බඳවා ගැනීම සිදුකෙරේ. මෙම සේවකයන් සංගමයේ දේපල අනිසි ලෙස පාවිච්චි කිරීමට පෙළඹෙන අතර, ඔවුන්ගේ අවශ්‍යතාවය සමහර විට සංගමයේ මූලධනය වැඩි කිරීම වන අතර, සාමාජිකයන්ගේ අවශ්‍යතාවය මීට වඩා වෙනස් වීම නිසා සාමාජිකයන් සංගමයෙන් ඉවත් වීම තුළින් සංවිධානය අභාවයට යා හැකිය.

ගොවීහු උපරිම නිෂ්පාදනයන් කිරීමටත්, කේවල් කිරීමේ ශක්තිය වැඩි කර ගැනීමටත් සහයෝගයෙන් කටයුතු කරති. මේ අතර ඇති වන ආර්ථික, තාක්ෂණික, සමාජයීය සහ දේශපාලන වෙනස්කම් මොවුන්ගේ අරමුණු ඉටු කර ගැනීමට බාධා පමුණුවයි. එම නිසා මෙවැනි සංවිධානයක, සංගමයක හෝ සමුපකාරයක දියුණුව රඳා පැවතීමට නම් එම සංගමය පටන් ගැනීමට පෙර ඒ ප්‍රදේශයේ පවතින විශේෂ සමාජ ආර්ථික තත්ත්වයන් හඳුනා ගැනීම අවශ්‍යය. ඊට පසු එම ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතා හා අරමුණු හඳුනා ගැනීම අත්‍යාවශ්‍යය. දේශපාලන හා සමාජ ආර්ථික තත්ත්වයන් ගොවීන්ගේ අවශ්‍යතාවනට තදින්ම බලපාන බැවින් සංගමයක් හෝ නිෂ්පාදකයන්ගේ සමුපකාරයක් පිහිටුවීමේදී මේ කරුණු ගැන නොසලකා හැරීම කිසිසේත්ම නොකළ හැක්කකි. එසේ නැතහොත් සාමාජිකයන් සංගමයෙන් ඉවත්වීම හෝ සංගමයේ සංවර්ධනයට කිසිම සහයෝගයක් නොදීම තුළින් සංගමය අභාවයට යාමට හැකිය.

සමුපකාරයකට හෝ සංවිධානයකට පැවරී ඇති රාජකාරිය මනාව හඳුනා ගත යුතු වන්නේ බාහිර සාධක මෙවැනි සංවිධානයක සංවර්ධනයට හා පැවැත්මට ඉතාම ඉවහල් වන බැවිනි. රාජ්‍ය ප්‍රතිපත්ති සහ අලෙවිකරණ ව්‍යුහය සංගමයේ දියුණුව උදෙසා වන ප්‍රතිපත්තිවලට අනුකූල විය යුතුය. ආර්ථික සමාජ හා තාක්ෂණික වෙනස්කම් හඳුනා ගත හැකි නම් ඒ තුළින් සංගමයක් හෝ සමුපකාරයක් සමාජ ආර්ථික සංවිධානයක් ලෙස උපයෝගී කර ගනිමින් ගොවීන්ට තමන්ගේ පරමාර්ථ හා අරමුණු සාමූහිකව විසඳ ගැනීමට හැකියාව ලැබෙන බව අවසාන වශයෙන් කිව හැකිය.